**මධ්‍යම සංස්කෘතික අරමුදල - 2017**

**------------------------------------------**

මධ්‍යම සංස්කෘතික අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල පනතේ 9 (2) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මධ්‍යම සංස්කෘතික අරමුදල පනතේ 9 (4) වගන්තිය ප්‍රකාර අරමුදලේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට මධ්‍යම සංස්කෘතික අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01**

(i) ප්‍රමිතයේ 29(ඇ) ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වගකීම් යටතේ දක්වා තිබුණු රු.9,138,563 ක් වූ විශේෂ අරමුදල් ව්‍යාපෘති 11 ක්, රු.4,817,900 ක් වූ විදේශ අරමුදල් ව්‍යාපෘති 05 ක් සහ ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණු රු.676,432 ක් වූ විදේශ අරමුදල් ව්‍යාපෘති 01ක් සම්බන්ධයෙන් එම අරමුදල්වල ස්වභාවය, අරමුදල ලැබුණු වර්ෂය, අරමුදල ලැබුණේ කුමන කරුණක් සඳහාද යනාදී තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

(ii) 2017 දෙසැම්බර් 31 දිනට අරමුදල භාරයේ පැවති නීත්‍යානුකූල අයිතිය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සතුවූ පුරාවස්තු 2,139 ක් සම්බන්ධයෙන් ප්‍රමිතයේ 29(ඇ) ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

**(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02**

(i) ප්‍රමිතයේ 09 ඡේදය අනුව මාස 03 ක් හෝ ඊට අඩු කාලයක් තුල කල් පිරෙන ආයෝජන, මුදල් හා මුදල් සමාන දෑ ලෙස හඳුනා ගතයුතු නමුත් රු.633,450,476 ක් වටිනා කෙටිකාලීන ආයෝජන සහ ප්‍රධාන කාර්යාලයෙහි වූ සුළු මුදල් ශේෂය වන රු.225,217 ක මුදල් හා මුදල් සමාන දෑ යටතේ දක්වා නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය තුළදී ස්ථාවර තැන්පතුවල ආයෝජනය කරන ලද එ.ජ.ඩො 1,460,000ක වටිනාකම වූ රු.221,059,900 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුළ ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ගලා යාමක් ලෙස සටහන් කිරීම වෙනුවට මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ වූ කාරක ප්‍රාග්ධන විචලනය තුළ දක්වා තිබුණි.

(ඇ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 06**

-----------------------------------------------------

ප්‍රමිතයේ 29 (එ) ඡේදය අනුව හඳුනාගත යුතු සහ 28 වන ඡේදය අනුව වාර්තා කරන දිනෙන් පසු සිදුවන ප්‍රමාණාත්මක, නොගැලපූ සිදුවීම් ප්‍රභේදයන් පිළිබඳ හෙළිදරව් කිරීම් කළයුතු වුවත් 2017 දෙසැම්බර් 31 දිනට පැවති විනිමය හුවමාරු අගය අඛණ්ඩව ඉහල යාම හේතුවෙන් අරමුදලේ විනිමය හුවමාරු ගනුදෙනු සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක බලපෑමක් ඇති වී තිබුණද එය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඈ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07**

-----------------------------------------------------

(i) ප්‍රමිතයේ 65 වන ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.126,292,230 ක් වූ මෝටර් රථ සහ රු.16,867,630 ක් වූ ගොඩනැගිලි සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 69 වන ඡේදය ප්‍රකාරව වත්කමක් පාවිච්චි කිරීම සඳහා සූදානම් තත්ත්වයට ගෙන ආපසු ක්ෂය කිරීම ආරම්භ කළයුතු අතර වත්කමක් හඳුනා ගැනීමෙන් ඉවත් කළ පසු ක්ෂය කිරීම නවතා දැමිය යුතුය. එහෙත් ඊට පටහැනි ලෙස අරමුදල විසින් දේපළ පිරියත හා උපකරණ මිලදීගත් වර්ෂය සඳහා සම්පූර්ණයෙන්ම ක්ෂය කිරීම හා වත්කම් ඉවත් කරන වර්ෂයේදී ක්ෂය නොකිරීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කර, පාවිච්චි කිරීමට සූදානම් තත්ත්වයට පත්වූ දිනය නොසලකා සමාලෝචිත වර්ෂය තුළදී මිලදී ගත් එකතුව රු.81,968,622 ක්වූ ස්ථාවර වත්කම්, සම්පූර්ණ වර්ෂයටම ක්ෂය කර තිබුණි.

(ඉ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 09**

-----------------------------------------------------

ප්‍රමිතයේ 15 වන ඡේදය අනුව, පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට තොග අගය කළ යුතු වුවද ඊට පටහැනිව ව්‍යාපෘති 06 ක අවසන් තොගය ඍජුවම විකුණුම් මිලට අගය කර රු.10,441,493 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

**2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රකාශන, අනුරූ හා පරිභෝජන ද්‍රව්‍ය අගය කරනු ලබන පදනම පමණක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු නමුත් ප්‍රවේශ පත්‍ර තොග අගය කරනු ලබන පදනම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) අඩමාණ ණය වෙන්කිරීම සම්බන්ධයෙන් අරමුදල විසින් අනුගමනය කරනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණු අතර වර්ෂ 05 කට වැඩි කාලයක සිට පැවත එන අයනොවන ණයගැති ශේෂය රු.3,388,452 ක් සමාලෝචනය කිරීමකින් තොරව රු.1,964,833 ක අඩමාණ ණය වෙන්කිරීම් සිදුකර තිබුණි.

(ඇ) අරමුදල විසින් සමාලෝචිත වර්ෂයේ සිට පශ්චාත් සේවක ප්‍රතිලාභ සඳහා වෙන්කිරීම් සිදුකර තිබුණද, වර්ෂයට අදාළ වෙන්කිරීම් ප්‍රමාණය ගණනය කිරීම සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 හි 15 ඡේදය පරිදි, ප්‍රමිත නිර්මාණය කරන ආයතනවල මෑත කාලීන

ප්‍රකාශ කිරීම් අනුව, අනාගත සේවක වැටුප් වැඩිවීම්, වට්ටම් අනුපාතිකය, සේවක පිරිවැටුම හා අනෙකුත් ආයුගණක උපකල්පන පදනම් කරගෙන පශ්චාත් සේවක ප්‍රතිලාභ වෙන්කිරීම් සඳහා ප්‍රතිපත්තියක් සකස් කර ගත යුතු වුවත් එපරිදි ප්‍රතිපත්තියක් සකස් කර ගැනීමකින් තොරව සේවකයින් විසින් අවසානවරට ලබාගත් වැටුප හා සේවා කාලය පමණක් පදනම් කරගෙන සේවකයින් 2,562 ක් සඳහා සමාලෝචිත වර්ෂයේදී පාරිතෝෂික ලෙස එකතුව රු.680,154,693 ක වෙන්කිරීම් සිදුකර තිබුණි.

(ඇ) අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 1.1 අනුව, මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව පිළියෙල කරන බවද එම ප්‍රමිතයන් යොදා ගැනීමට නොහැකි අවස්ථාවන්හිදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත යොදාගන්නා බවද දක්වා තිබුණි. නමුත් අරමුදල විසින් කුමන අයිතමයන් සඳහා කවර ගිණුම්කරණ ප්‍රමිතයක් භාවිතා කරන්නේද, එහිදී අරමුදලේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය කුමක්ද යනාදී විස්තර මූල්‍ය ප්‍රකාශන වල පැහැදිලිව දක්වා නොතිබුණි.

## 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පතු ශේෂය එ.ජ.ඩො 1,460,000 ක් හා ඉතිරිකිරීමේ ගිණුමේ ශේෂය එ.ජ.ඩො 246,398 ක් වූ අතර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී එදිනට පැවති විදේශ විනිමය හුවමාරු අනුපාතය වන රු.150.9156 ක් පදනම් කරගෙන රුපියල් අගය ගණනය කිරීම වෙනුවට 2017 දෙසැම්බර් 29 දිනට පැවති අනුපාතය වන රු.151.3076 ක් යොදා ගැනීම හේතුවෙන් විදේශ විනිමය හුවමාරු අලාභය රු.668,908 ක් අඩුවෙන් හා විදේශ විනිමය ඉතුරුම් ගිණුමෙහි ශේෂය රු.96,588 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) 1985-2012 කාලපරිච්ඡේදය තුළ පෞද්ගලික, රජයේ ආයතන සහ විදේශ රටවලින් අරමුදලට ලැබුණු රු. 428,110,000 ක ප්‍රාග්ධන ප්‍රදාන සහ 1981-2011 කාලපරිච්ඡේදය තුළ අරමුදලට ලැබුණු රු.226,754,060 ක් වූ විදේශ ප්‍රාග්ධන ප්‍රදාන, ක්‍රමානුකූල පදනමක් මත විලම්භිත ආදායම් ලෙස හඳුනාගැනීම සඳහා පැහැදිලි ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ විලම්භිත ආදායම් ලෙස රු.22,597,491 ක් ගිණුම්ගත කර තිබුණි.

## 2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනට පාරිතෝෂික වෙන්කිරීමේ ගිණුමේ ශේෂය රු.680,154,693 ක් වුවද ඊට අනුරූපීව පවත්වා ගෙන තිබුණු පාරිතෝෂික ආයෝජන ගිණුමේ ශේෂය රු.685,741,723 ක් විය. ඒ අනුව වූ රු.5,587,030 ක වෙනස සසඳා නොතිබුණි.

(ආ) විගණනයේ ගණනය කිරීම් අනුව 2017 දෙසැම්බර් 31 දිනට පැවති ප්‍රකාශන තොගයේ වටිනාකම රු.17,541,033 ක් වුවද සටහන් අංක 12 අනුව එය රු.32,865,653 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.15,324,620 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම්

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
| --- | --- | --- |
| | රු. | |
| (අ) සේවක ණයගැතියෝ | 94,368,893 | විස්තරාත්මක උපලේඛන |
| (ආ) ප්‍රවේශපත් තොගය | 879,350 | තොග සමීක්ෂණ වාර්තා |

## 2.3 ලැබියයුතු ගිණුම්

විගණනයට ඉදිරිපත් කරන ලද ණයගැති කාල විශ්ලේෂණය අනුව, වර්ෂ 05 ඉක්මවූ නිවාස ණය, උත්සව අත්තිකාරම් හා විශේෂ අත්තිකාරම් ණය ශේෂ පිළිවෙලින් රු.18,368,291 ක් රු.433,010 ක් හා රු.87,991 ක් වූ අතර එම ණය අයකර ගැනීමට අරමුදල විසින් ඵලදායී පියවරක් ගෙන නොතිබුණි.

## 2.4 නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල පනත | |
| (i) 4 (ඉ) වගන්තිය | පනතේ විධිවිධානයන්ට යටත්ව සියලු කරුණු ඇතුළත් වනසේ විධිමත් රීති මාලාවක් සකස් කිරීමට ආරම්භයේ සිට මේ වන තෙක් අරමුදල විසින් කටයුතු කර නොතිබුණි. |
| (ii) 4 (ඊ) වගන්තිය | අරමුදලේ මුදල් ආයෝජනය කිරීමට සහ එම ආයෝජන ආපසු ලබා ගැනීමට පාලක මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතු වුවද 2017 වර්ෂය තුළදී ස්ථාවර තැන්පතු වල ආයෝජනය කළ රු.1,100,000,000 ක් සහ ඇමරිකන් ඩොලර් 1,460,000 (රු.220,343,200) ක් සඳහාද ආයෝජන ආපසු ලබාගැනීම් රු.362,736,222 ක් සඳහාද පාලක මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

(iii) 6 (ඉ) වගන්තිය

සංස්කෘතික ත්‍රිකෝණ වශයෙන් නිරූපණය කරනු ලැබ ඇති ප්‍රදේශයට ඇතුළුවන ආගන්තුකයින්ගෙන් සහ සංචාරකයන්ගෙන් ගාස්තු අයකරනු ලැබිය හැකි බව දක්වා තිබුණු නමුත් ඊට පටහැනිව සංස්කෘතික ත්‍රිකෝණයට අයත් නොවන ගාල්ල, රම්බාවිහාරය, අපේගම, කතරගම, යාපහුව හා බුදුරුවගල යන උරුම ස්ථාන වලින් සමාලෝචිත වර්ෂය තුළ රු.36,082,437 ප්‍රවේශපත්‍ර ආදායම් ලබාගෙන තිබුණි.

(ආ) 1940 අංක 9 දරන පුරාවස්තු ආඥාපනත

(i) 21 (1) වගන්තිය

- පුරාවිද්‍යා කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයක අධිකාරිය යටතේ හා එහි කොන්දේසි අනුව හැර හෝ 20 වන වගන්තිය යටතේ ඇතුළත් වූ ගිවිසුමක් අනුව හැර යම් ආරක්ෂිත ස්මාරකයක් ප්‍රතිසංස්කරණය, අලුත්වැඩියාව වෙනස් කිරීමේ හෝ අතිරේකව ඉදිකිරීමේ යම් කාර්යයක් ආරම්භ කිරීම නොකළ යුතු වුවත් පුරාවිද්‍යා වටිනාකමක් සහිත විහාරස්ථාන 04 ක් සඳහා සංවර්ධන කටයුතු කරගෙන යාම සඳහා පුරාවිද්‍යා කොමසාරිස්වරයාගේ ලබාගත් අවසරය පිළිබඳ පරීක්ෂා කිරීමකින් තොරව අරමුදල විසින් සමාලෝචිත වර්ෂය තුළ රු.906,996 ක් වටිනා පරිත්‍යාග මුදල් ලබාදී තිබුණි.

- රුවන්වැලිසෑය වැලිමළුව සංරක්ෂණය කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.25,053,596 ක් වැයකර තිබූ නමුත් එම කටයුතු ආරම්භ කිරීමට පුරාවිද්‍යා කොමසාරිස්වරයාගේ ලබාගත් අවසරය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය

------------------------------------

(i) II පරිච්ඡේදයේ 1:2 වගන්තිය

මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් ආයතන සංග්‍රහයට පටහැනිව අධ්‍යක්ෂ (ආගමික), අධ්‍යක්ෂ (සැලසුම්), වැඩ ඉංජිනේරු, ව්‍යාපෘති සම්බන්ධීකරණ අධ්‍යක්ෂ, පරීක්ෂණ නිලධාරී වැනි නව තනතුරු ඇති කිරීම සහ බඳවා ගැනීම සිදුකර තිබුණි. තවද අරමුදලේ හෝ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාවේ තනතුරු තුළ ඇතුළත් නොවූ මුරකරුවන් 2271 ක් සහ කම්කරුවන් 1130 ක් වශයෙන් සේවකයින් 3401 ක් පාලක මණ්ඩල අනුමැතිය මත පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සඳහා බඳවා ගෙන තිබුණි.

(ii) II පරිච්ඡේදයේ 9:1 වගන්තිය

රජයේ සේවයෙන් විශ්‍රාම ගිය තැනැත්තෙකු රජයේ සේවයේ තනතුරක නැවත සේවයේ යෙදවීමට හෝ රාජ්‍ය සංස්ථාවක සේවයේ යෙදීමට හෝ අමාත්‍ය මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය. එසේ වුවද පරීක්ෂා කරන ලද පෞද්ගලික ලිපිගොනු 29 කින් ලිපිගොනු 8 කට අදාළ නිලධාරීන් විශ්‍රාමික නිලධාරීන් වූ අතර එකී නිලධාරීන් සඳහා අමාත්‍ය මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබාගෙන තිබූ බව නිරීක්ෂණය නොවීය.

(iii) II පරිච්ඡේදයේ 13:4 උපවගන්තිය

පුරප්පාඩු වී තිබෙන තනතුරක වැඩ බැලීම සඳහා එම තනතුර දැරීමට සෑම අතින්ම පූර්ණ සුදුසුකම් නොලත් නිලධාරියකු පත් නොකළ යුතුය. එසේ වුවද බඳවාගැනීමේ පරිපාටියේ 4.3.4.1 වගන්තිය අනුව සුදුසුකම් නොමැති නිලධාරියකු සීගිරිය ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරණ තනතුරේ රාජකාරී ආවරණය කිරීම සඳහා 2017 ඔක්තෝබර් 02 දින කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

---------------------------------------

මුදල් රෙගුලාසි 381 (1)

අරමුදල විසින් 2017 මාර්තු 28 දින සිට විදේශ ව්‍යවහාර මුදලින් (ඇ.එ.ජ.ඩොලර්) ඉතුරුම් ගිණුමක් ආරම්භකර ගණුදෙනු පවත්වාගෙන යනු ලැබුවද ඒ සඳහා ලබාගත් භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඉ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

-----------------------------

(i) 2007 අගෝස්තු 24 දිනැති අංක 09/2007 (i) චක්‍රලේඛය

- වයස අවුරුදු 60 ඉක්මවූ විශ්‍රාමිකයෙකු රජයේ සේවයේ අනුමත තනතුරක නැවත සේවයේ නොයෙදවිය යුතු වුවද මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් බඳවාගත් දිනට වයස අවුරුදු 60 ඉක්මවූ නිලධාරීන් 5 දෙනෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණු බව නියැදි පරීක්ෂණයකින් අනාවරණය විය.

- වයස අවුරුදු 67 සම්පූර්ණ කළ කිසිවකු මොනම හේතුවක් නිසා හෝ රාජ්‍ය සේවයේ අනුමත තනතුරකට පත් නොකළ යුතුය. එසේ වුවද පරීක්ෂා කරන ලද විශ්‍රාමික නිලධාරීන් 9 දෙනෙකුගේ ලිපි ගොනු අතරින් වයස 67 ඉක්මවූ විශ්‍රාමික නිලධාරීන් 03 දෙනෙකු ප්‍රවාහන උපදේශක, සංරක්ෂණ නිලධාරී, කෞතුකාගාර විද්‍යාව පිළිබඳ උපදේශක යන තනතුරු වල සිටින බව නිරීක්ෂණය විය.

- විශ්‍රාමිකයෙකු නැවත සේවයේ යොදවනු ලබන කාලසීමාව තුළදී ආයතන ප්‍රධානියා විසින් සුදුසු අනුප්‍රාප්තිකයෙකු හඳුනාගනු ලැබිය යුතු අතර, එම නිලධාරියා පුරුදු කිරීමේ කාර්ය නැවත සේවයේ යොදවනු ලබන විශ්‍රාමික නිලධාරියාගේ වගකීමක් වශයෙන් ඔහුට පැවරිය යුතුය. එසේ වුවද ඒ අනුව කටයුතු කර නොතිබූ අතර දිගින් දිගටම එකී නිලධාරීන්ගේ සේවය දීර්ඝ කර තිබුණු බව නිරීක්ෂණය විය.

| | | |
|---|---|---|
| (ii) | 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන චක්‍රලේඛය - 7 ඡේදය | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව පාලක මණ්ඩල අනුමැතිය මත අරමුදල විසින් බඳවාගැනීම් සිදුකර තිබුණි. |
| (iii) | 2006 අප්‍රේල් 25 දිනැති අංක 06/2006 දරන චක්‍රලේඛය 15.2 උපවගන්තිය | කොන්ත්‍රාත් පදනම මත සේවයෙහි යොදවා ඇති පුද්ගලයින්ගේ වැටුප පවත්නා කොන්ත්‍රාත් කාලසීමාව තුළ සංශෝධනය නොකළ යුතුය. එසේ වුවද ප්‍රවාහන උපදේශක (තාක්ෂණික) නිලධාරියාගේ වැටුප පාලක මණ්ඩල පත්‍රිකාවක් මඟින් රු.15,000 සිට රු.30,000 දක්වා කොන්ත්‍රාත් කාලසීමාව තුළ සංශෝධනය කර තිබුණි. |
| (iv) | 2016 අප්‍රේල් 25 දිනැති අංක 02/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 03 (i) හා 03 (ii) ඡේද | (i) චක්‍රලේඛය ප්‍රකාරව සියයට 20 විශේෂ දීමනාව සහ අන්තර් දීමනාව වන රු.10,000 ක මුදල නව වැටුප් ව්‍යුහය තුළ අන්තර්ගත කර ඇති බව දක්වා තිබුණි. එසේ වුවද අරමුදල විසින් කොන්ත්‍රාත් පදනම මත බඳවාගන්නා නිලධාරීන්ට ඉහත විශේෂ දීමනාව සහ අන්තර් දීමනාව ඇතුළත් කර වැටුප් ගෙවන බව නියැදි පරීක්ෂාවකදී අනාවරණය විය. ඒ අනුව පරීක්ෂා කරන ලද ලිපිගොනු 04 කට අදාළව නිලධාරීන් 04 දෙනෙකු සඳහා 2016,2017 සහ 2018 ජූලි මස දක්වා විශේෂ දීමනා වශයෙන් රු.403,470 ක්ද අන්තර් දීමනා වශයෙන් රු.457,689 ක්ද ඊට අදාල සේවක අර්ථසාධක අරමුදල් සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට දායකය (12% + 3%) රු.129,185 ක්ද වශයෙන් එකතුව රු.990,344 ක් වැඩිපුර ගෙවා තිබුණි.<br><br>(ii) 19.2 ඡේදයට අනුව 2006 ජනවාරි 01 දිනට පසු ලබාදී තිබුණු පත්වීම් සඳහා අදාළ විය යුත්තේ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 අනුව නියමිත වැටුප් පරිමාණයේ ආරම්භක ශ්‍රේණියේ ආරම්භක වැටුප් පියවර වේ. එසේ වුවද මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් කොන්ත්‍රාත් පදනම මත බඳවාගන්නා ලද නිලධාරීන් සඳහා ඊට ඉහළ වැටුප් පියවරයන්හි පිහිටුවා වැටුප් ගෙවා තිබූ බව නිරීක්ෂණය විය. ඒ අනුව පරීක්ෂා කරන ලද ලිපිගොනු 5 ක් අතරින් නිලධාරීන් 04 දෙනෙකුට අදාළව ඉහත වැටුප් පියවරයන් ලබා දී තිබූ අතර ඒ අනුව ඉහත |

නිලධාරීන් සඳහා වැඩිපුර ගෙවූ මුදල රු.450,821 ක් විය.

| | | |
|---|---|---|
| (ඊ) | **රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ**<br>--------------------------- | |
| | (i) 2015 මැයි 25 දිනැති අංක PED/1/2015 දරන චක්‍රලේඛය 3.1 ඡේදයේ 2 අනු ඡේදය | (i) අධ්‍යක්ෂ ජනරාල්වරයාට හිමිවිය යුතු මාසික ඉන්ධන දීමනාව ලීටර් 150 ක් වුවද 2016 ජනවාරි සිට 2017 අගෝස්තු දක්වා වූ මාස 20 ක කාල සීමාව සඳහා මාසිකව ලීටර් 170 බැගින් ගෙවා තිබුණි. ඒ අනුව සීමාව ඉක්මවා ගෙවා තිබූ ඉන්ධන වෙනුවෙන් වැඩිපුර ගෙවා තිබූ රු.51,200 ක් අදාළ නිලධාරියාගෙන් හෝ වගකිව යුතු පුද්ගලයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| | (ii) 3.1 ඡේදයේ 4 අනු ඡේදය | 2006 වර්ෂයේ නිකුත් කරන ලද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක MSD 30 ප්‍රකාරව HM 1 – 1 ශ්‍රේණිය හෝ ඊට ඉහළ එම දෙපාර්තමේන්තුවෙන් අනුමත කරන ලද තනතුරක් දරන වෙනත් ඕනෑම නිලධාරියෙකු ලීටර් 120 ක මාසික ඉන්ධන දීමනාවක් ලැබීමට හිමිකම් ලබන බව දක්වා තිබුණි. එසේ වුවද ඊට පටහැනිව නිලධාරීන් 08 දෙනෙකුට අනුමත ඉන්ධන සීමාව ඉක්මවා වැඩිපුර රු.243,930 ක් ගෙවා තිබුණු අතර එම මුදල අදාළ නිලධාරියාගෙන් හෝ වගකිව යුතු පුද්ගලයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (උ) | **රාජ්‍ය මුදල් චක්‍රලේඛ**<br>------------------------ | |
| | 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන චක්‍රලේඛය | චක්‍රලේඛයේ 4.1 (ඇ) වගන්තිය ප්‍රකාරව අනුමත අයවැය ලේඛනයකින් තොරව අදාළ මුදල් වර්ෂයේදී කිසිදු වියදමක් නොදැරිය යුතුය. එහෙත් අයවැය ඇස්තමේන්තුව මගින් මුදල් වෙන්කර නොතිබියදී අන්තර්ජාලය මගින් විද්‍යුත් ප්‍රවේශපත්‍ර නිකුත් කිරීමේ ව්‍යාපෘති කාර්යය වෙනුවෙන් පරිගණක හා උපාංග සහ ජාල පහසුකම් ලබාගැනීම වෙනුවෙන් අරමුදල විසින් 2017 වර්ෂය තුළ රු. 391,180 ක ප්‍රාග්ධන වියදම් දරා තිබුණි. |
| (ඌ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2011 ජූලි 21 දිනැති අංක ඩීඑම්එස්/ඊ1/54/9/241 දරන ලිපිය | ලිපියේ 04 ඡේදයට අනුව, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ විධිමත් අනුමැතියකින් තොරව අනුමත කාර්ය මණ්ඩලයට අතිරේකව නව තනතුරු ඇති කිරීම හා 2011 ජූනි 30 දිනෙන් පසුව අනුමත තනතුරුවල පුරප්පාඩු පිරවීම සිදු නොකළ යුතුය. එහෙත් අරමුදල විසින් විවිධ ව්‍යාපෘති ඇති කරමින් අධ්‍යක්ෂ (ආගමික), අධ්‍යක්ෂ (සැලසුම්), වැඩ ඉංජිනේරු, ව්‍යාපෘති සම්බන්ධීකරණ අධ්‍යක්ෂ, පරීක්ෂණ නිලධාරී වැනි තනතුරු සඳහා සේවක බඳවා ගැනීම් සිදුකර තිබුණි. |

**2.5 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

---

1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල් පනතේ 4 (ඇ) උපවගන්තිය අනුව සමාලෝචිත වර්ෂය තුළදී අරමුදල විසින් නිෂ්පාදනය කරන ලද රු.5,548,700 ක් වටිනා අනුරූ හා මුද්‍රණය කළ රු.375,093 ක ප්‍රකාශන පරිත්‍යාග සඳහා පාලක මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

---

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

---

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 1,471,822,640 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 1,696,834,303 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලය රු.225,011,663 කින් එනම් සියයට 13.2 කින් පිරිහී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මුළු ආදායම රු. 669,493,497 කින් වර්ධනය වී තිබුණද වැටුප්, වේතන හා සේවක ප්‍රතිලාභ වියදම රු.303,022,305 කින්ද, අනෙකුත් වියදම් රු.544,504,410 කින්ද කොන්ත්‍රාත් සේවා වියදම් රු.22,997,847 කින්ද සැපයුම් හා පරිභෝජන වියදම රු.13,309,772 කින්ද වැඩිවී තිබීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේදී රු.302,069,090 ක්වූ අතිරික්තය 2016 වර්ෂය දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණ ද 2017 වර්ෂයේදී පිරිහීමට ලක්වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය වීම් නැවත ගැලපීමෙන් පසු 2013 වර්ෂයේ රු.1,065,769,479 ක් වූ දායකත්වය 2016 වර්ෂය අවසානයට රු.3,034,217,986 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබූ නමුත් 2017 වර්ෂයේදී රු. 2,974,285,411 ක් දක්වා අඩු වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

---

**4.1 කාර්යසාධනය**

---

**4.1.1 සැලසුම් කිරීම**

---

2014 පෙබරවාරි 14 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව පාර්ලිමේන්තු පනත් මගින් සංස්ථාපිත ආයතන විසින් දිගු කාලීන දැක්මක් සහිතව අදාළ පනතේ සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම ඉලක්ක කරගත් ක්‍රියාකාරකම් ඇතුළත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු වේ. එසේ වුවද අරමුදල විසින් 2017 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර අරමුදල විසින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතීන්ට අදාළ කැණීම්, සංරක්ෂණ, පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් පිළිබඳ වැඩ සැලැස්මක් පමණක් පිළියෙල කර තිබුණි.

**4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය**

---

අරමුදල විසින් ඉටුකළ යුතුව තිබුණු කාර්යභාරයන් හා ළඟා කරගත් ප්‍රගතිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංචාරක මණ්ඩල වෙබ් අඩවියෙන් ලබාගත් තොරතුරු වලට අනුව, 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා ලංකාවට පැමිණි සංචාරකයින් සංඛ්‍යාව හා අරමුදලේ පොත්පත් අනුව, අරමුදල විසින් අලෙවි කළ සංචාරක ප්‍රවේශපත්‍ර සංඛ්‍යාව අතර විශ්ලේෂණයක් පහත දැක්වේ.

| වර්ෂය | ලංකාවට පැමිණි සංචාරකයින් සංඛ්‍යාව | අරමුදල විසින් අලෙවිකළ සංචාරක ප්‍රවේශපත්‍ර ප්‍රමාණය | අලෙවිකළ ප්‍රවේශපත්‍ර ප්‍රමාණය සංචාරකයින්ට සාපේක්ෂව ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| 2013 | 1,274,593 | 504,699* | 39* |
| 2014 | 1,527,153 | 627,136 | 41 |
| 2015 | 1,798,380 | 722,676 | 40 |
| 2016 | 2,050,832 | 923,204 | 45 |
| 2017 | 2,116,407 | 994,556 | 46 |

*එක් සංචාරකයකු විසින් එක් පුරාවිද්‍යාත්මක ස්ථානයක් පමණක් නරඹන්නේ යයි උපකල්පනය කර ගණනය කිරීම් සිදුකරන ලදී.

ඉහත තොරතුරු අනුව 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා ලංකාවට පැමිණි සංචාරකයින් සංඛ්‍යාවට සාපේක්ෂව අරමුදල විසින් අලෙවිකළ ප්‍රවේශපත්‍ර ප්‍රමාණය සියයට 39 ත් සියයට 47 ත් අතර පරාසයක් ගෙන තිබුණි. ඒ අනුව පෞරාණික සංස්කෘතික නටඹුන් සහිත ස්ථාන නැරඹීම හා ආගමික කටයුතු ප්‍රවර්ධනය සඳහා සංචාරකයින් ආකර්ෂණය කරගැනීමට අලෙවි ප්‍රවර්ධන වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම තුළින් තවදුරටත් ආදායම් වර්ධනය කර ගැනීමේ හැකියාවක් පවතින බව නිරීක්ෂණය කෙරේ.

(ආ) ආයතනය විසින් සකස් කර තිබුණු වැඩ සැලැස්ම අනුව, වර්ෂය තුළ ආරම්භ කර වර්ෂය තුළ නිම කරන ලද ක්‍රියාකාරකම් 35කට අදාළව ඇස්තමේන්තු ප්‍රතිපාදනය හා සත්‍ය වියදම් සැසඳීමේදී ඉතිරිය සියයට 10 ත් සියයට 99 ත් අතර පරාසයක පැවතුණි.

(ඇ) අරමුදලේ වාර්ෂික වැඩ සැලැස්මට අනුව, සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද ඇස්තමේන්තුගත පිරිවැය රු. 439,938,818 ක් වූ යටිතල පහසුකම් සංවර්ධනය, සංරක්ෂණ කටයුතු වැනි ක්‍රියාකාරකම් 34 ක් අරමුදල විසින් සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාවට නංවා නොතිබුණි.

(ඈ) වාර්ෂික වැඩ සැලැස්මට පරිබාහිරව සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාකාරකම් 04 ක් ක්‍රියාවට නංවා තිබූ අතර ඒ සඳහා දරන ලද වියදම රු. 6,066,320 ක් විය.

(ඉ) වැඩ සැලැස්මේ ඇතුළත් ක්‍රියාකාරකම්වල, අපේක්ෂිත නිමැයුම/ප්‍රතිඵල වැඩ සැලැස්මෙහි දක්වා තිබුණි.

(ඊ) සංස්කෘතික හා ආගමික ස්ථාන අළුත්වැඩියා කටයුතු සඳහා අදියර 1 සහ අදියර 2 යටතේ දිස්ත්‍රික්ක 19 ක් තුළ පිහිටි ආගමික ස්ථාන 965 ක් සඳහා අරමුදල විසින් රු.497,741,581 ක මුදල් පරිත්‍යාගකර තිබුණි. ආගමික ස්ථාන 965 ක් අතරින් ආගමික ස්ථාන 316 ක් එනම් සියයට 33 ක ප්‍රමාණයක් කුරුණෑගල දිස්ත්‍රික්කයේ විහාරස්ථාන වෙත ලබා දී තිබූ අතර මුළු පරිත්‍යාග වටිනාකම අනුව ගත්කළ එය සියයට 26 ක් පමණ විය. තවද පරිත්‍යාග ලබාදුන් මුළු ආගමික ස්ථාන ප්‍රමාණයට සාපේක්ෂව එක් දිස්ත්‍රික්කයක් සඳහා ලබාදුන් පරිත්‍යාග වටිනාකමේ ප්‍රතිශතය සියයට 1 කට අඩු දිස්ත්‍රික්ක 04 ක්ද, සියයට 1ත් 5ත් අතර දිස්ත්‍රික්ක 8 ක්ද, සියයට 6ත් 10ත් දිස්ත්‍රික්ක 5 ක්ද සියයට 10 ත් සියයට 15 ත් අතර දිස්ත්‍රික්ක 1 ක්ද විය. එමෙන්ම දිස්ත්‍රික්ක 05 ක් සඳහා කිසිදු පරිත්‍යාග මුදලක් ලබාදී නොතිබුණු බවද නිරීක්ෂණය විය. ඒ අනුව පරිත්‍යාග ලබාදීමේදී අරමුදල විසින් සාධාරණ පදනමක් මත සමස්ත දිවයිනම

ආවරණය වන පරිදි පරිත්‍යාග බෙදී යන විධිමත් ක්‍රමවේදයක් සකසා ක්‍රියාවට නැංවීමට අපොහොසත්ව තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කොළඹ ප්‍රධාන කාර්යාලය පිහිටි භූමියේ නීත්‍යානුකූල අයිතිය අරමුදලට පවරා ගැනීමට 2018 සැප්තැම්බර් 30 දක්වාම කටයුතු කර නොතිබුණි.

(ආ) අධ්‍යාපන අමාත්‍යාංශ අධීක්ෂණය යටතේ පැවති අපේගම ආයතනයේ අධීක්ෂණ කටයුතු මධ්‍යම සංස්කෘතික අරමුදලට පැවරීම සඳහා දෙපාර්ශවය විසින් 2016 ජුනි 16 දිනැති අංක ඊඩී/10/එන්එච්/03/02/01/07 දරන අවබෝධතා ගිවිසුමට අත්සන් තබා තිබුණි. ගිවිසුමේ 08 ඡේදයට අනුව වහාම ක්‍රියාත්මක වන පරිදි අපේගම ආයතනයේ සියලු ගොඩනැගිලි සහ භාණ්ඩ විධිමත් පරිදි අධ්‍යාපන අමාත්‍යාංශය වෙතින් භාර ගැනීමට කටයුතු කළයුතු වුවද අරමුදල විසින් 2018 සැප්තැම්බර් 28 දින දක්වා එසේ සිදුකර නොතිබුණි.

(ඇ) අන්තර්ජාලය මගින් විද්‍යුත් ප්‍රවේශපත්‍ර නිකුත් කිරීමේ ව්‍යාපෘතියේ අරමුණු, කාර්යයන්, ඊට අදාළ කාල රාමුව, වගකිව යුතු පාර්ශවයන්, මානව හා භෞතික සම්පත්වල අවශ්‍යතාවය හා දැරීමට සිදුවන පිරිවැය පිළිබඳ නිසි හඳුනාගැනීමක් හෝ ඒ පිළිබඳ ශක්‍යතා අධ්‍යයනයක් අරමුදල විසින් සිදුකර නොතිබීම හේතුවෙන් අන්තර්ජාලය මගින් ප්‍රවේශපත්‍ර නිකුත් කිරීමේ කටයුතු ආරම්භ කිරීමට 2018 අගෝස්තු 30 දින වනවිටද අපොහොසත් වී තිබූ අතර අන්තර්ජාලය හරහා ගෙවීම් කිරීම පමණක් සිදුකරනු ලබන බව නිරීක්ෂණය විය.

(ඈ) 2010 නොවැම්බර් 20 දිනැති අංක පීඑෆ්/4/සීඑම්/1(Cir) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 2.2 ප්‍රකාරව, විද්‍යුත් මාධ්‍ය හරහා ගෙවීම් ලබාගැනීමට අවශ්‍ය බලය සහ වගකීම සේවකයන් වෙත ලබාදීම හා එම ගෙවීම් සඳහා උචිත අභ්‍යන්තර පාලන පද්ධතියක් හා ආරක්ෂක පද්ධතියක් ඇතිකිරීම රාජ්‍ය ආයතන ප්‍රධානීන් විසින් සිදුකළ යුතු වේ. ඒ අනුව අන්තර්ජාලය හරහා විද්‍යුත් ප්‍රවේශපත් නිකුත් කිරීමේ පද්ධතියක් නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා තොරතුරු තාක්ෂණ දැනුම සහිත කාර්යමණ්ඩලයක් අරමුදලේ සේවයේ යෙදවීම අත්‍යවශ්‍ය වන නමුත් එවැනි කාර්යමණ්ඩලයක් බඳවාගැනීමට අරමුදල විසින් මේ වන තෙක් කටයුතු කර නොතිබුණි.

(ඉ) දැනට ක්‍රියාත්මක වන අන්තර්ජාලය මගින් ගෙවීම් කිරීමේ පද්ධතිය ක්‍රියාවට නැංවීම සඳහා දැනුමැති කාර්යමණ්ඩලයක් අරමුදල තුළ නොවූයෙන් පද්ධතියේ පාලන කටයුතු ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය මගින් සිදුකරනු ලබන අතර එය අරමුදලේ තොරතුරුවල රහස්‍යභාවය කෙරෙහි බලපෑමක් ඇති කරන බව නිරීක්ෂණය වේ.

(ඊ) මධ්‍යම සංස්කෘතික අරමුදල සඳහා කැබ්රථ මිලදී ගැනීමට අදාළව 2016 වර්ෂයේදී පවත්වන ලද මූලික පරීක්ෂණයේදී නිලධාරීන් 11 දෙනෙකු චෝදනා ලබාතිබූ නමුත් ඒ අතුරින් තෝරාගත් නිලධාරීන් තිදෙනෙකුට පමණක් විධිමත් විනය පරීක්ෂණ ආරම්භ කර තිබූ අතර එම විධිමත් විනය පරීක්ෂණ 2018 නොවැම්බර් 06 දින වන විටද නිමකිරීමට අරමුදල අපොහොසත්ව තිබුණි. අනෙකුත් නිලධාරීන් 08 දෙනා සම්බන්ධව විධිමත් විනය පරීක්ෂණ ආරම්භ කර නොතිබීම මතභේදාත්මක කරුණක් ලෙස නිරීක්ෂණය කෙරේ.

(උ) මධ්‍යම සංස්කෘතික අරමුදලේ ත්‍රිකුණාමලය ව්‍යාපෘතියේ සේවය කළ සේවකයකු වෙත ගෙවිය යුතු පාරිතෝෂිත මුදල අඩුවෙන් ගෙවීම් කිරීම හේතුවෙන් අධිභාර ලෙස රු.30,423 ක් අරමුදලින් දැරීමට සිදු වී තිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අනුරූ නිෂ්පාදන, ප්‍රකාශන හා මුද්‍රණ යන අංශ වල නිෂ්පාදන පිරිවැය ගණනය කිරීමේ දී සමාලෝචිත වර්ෂයට අදාළ සෘජු වියදම් පමණක් සැලකිල්ලට ගෙන තිබුණු අතර වක්‍ර පිරිවැය පිළිබඳ සැලකිල්ලක් දක්වා නොතිබුණි. ඒ අනුව අනුරූ නිෂ්පාදනයන්හි නිෂ්පාදන පිරිවැය නිවැරදිව හඳුනා ගැනීමෙන් පසුව විකුණුම් මිල තීරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2017 වර්ෂය සඳහා ප්‍රගති වාර්තා අනුව අනුරාධපුර මහාවිහාර ව්‍යාපෘතියේ ගොඩනැගිලි නඩත්තුව, විද්‍යාත්මක නඩත්තුව හා දෛනික නඩත්තු කටයුතු හා රුවන්වැලිසෑය වැලි මළුව සංරක්ෂණය කිරීම වෙනුවෙන් ඇස්තමේන්තුගත මිනිස් දින ගණන 13914 ක් වූ අතර වැඩකළ මිනිස් දින ගණන 20358 ක් වී තිබුණි. මේ අනුව ඇස්තමේන්තු ඉක්මවා මිනිස් දින 6444 ක් වෙනුවෙන් රු.11,920,937 ක් වැයකර තිබූ අතර ඇස්තමේන්තුවේ නිවැරදිතාවය පිළිබඳ විගණනයේදී ගැටළු සහගත විය.

(ඇ) අරමුදල විසින් උරුම ස්ථාන නැරඹීම සඳහා පැමිණෙන සංචාරකයන් වෙත නිකුත් කරනු ලබන ප්‍රවේශපත්‍ර අරමුදලේ කොළඹ 07 පිහිටි මුද්‍රණ අංශයේ මුද්‍රණය කරනු ලැබේ. ඒ සඳහා 300 GSM ඝනකම සහිත දිග හා පළල පිළිවෙලින් මිලිමීටර් 900 ක් හා 600 ක් වූ කඩදාසියක් භාවිතා කරමින් මිලිමීටර් 285 ක් දිග මිලිමීටර් 88 ක් පළල ප්‍රවේශ පත්‍රයක් මුද්‍රණය කරනු ලැබේ. අනුරාධපුර, පොළොන්නරුව හා සීගිරිය යන උරුම ස්ථාන සඳහා නිකුත් කරනු ලබන ප්‍රවේශ පත්‍රයක භෞතික ප්‍රමාණය අනුව කඩදාසියකින් මුද්‍රණය කළයුතු ප්‍රවේශපත්‍ර ප්‍රමාණය සහ මුද්‍රණය කර තිබූ ප්‍රවේශපත්‍ර ප්‍රමාණය පිළිබඳ පරීක්ෂාවේදී 2015 සිට 2017 දක්වා වූ වර්ෂ සඳහා ප්‍රවේශපත්‍ර 319,794 ක අඩුවක් නිරීක්ෂණය විය.

## 4.4 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2011 පෙබරවාරි 10 දිනැති අංක අමප/11/0169/555/004 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අනුව අරමුදල විසින් උපයා ගනු ලබන ප්‍රවේශ පත්‍ර ආදායමින් සියයට 25 ක් පුරාවිද්‍යා ස්ථාන පවත්වාගෙන යාම වෙනුවෙන් පුරාවිද්‍යා කළමනාකරණ භාරය වෙත ලබාදිය යුතු වේ. ඒ අනුව 2017 වර්ෂයේ අරමුදලේ ආදායම වූ රු.3,829,262,911 කින් සියයට 25 ක් ලෙස රු.957,315,728 ක් එම භාරය වෙත ලබාදිය යුතු වුවද ලබාදී තිබුණේ රු.193,060,865 ක් පමණි.

(ආ) මාස 03 කින් කල්පිරීමට නියමිත රු.582,489,594 ක් වූ ස්ථාවර තැන්පතු 06 ක් සහ රු.50,960,882 ක් වූ මාසයකින් කල්පිරෙන ස්ථාවර තැන්පතුවක් තිබියදී අරමුදල විසින් මාස 12 කින් කල්පිරෙන එකතුව රු.125,000,000 ක් වටිනා ස්ථාවර තැන්පතු 02 ක් කල් පිරීමට පෙර ආපසු ලබා ගැනීම හේතුවෙන් 2017 වර්ෂය තුළදී අරමුදල වෙත රු.13,150,343 ක පොලී ආදායමක් අහිමි වී තිබුණි.

## 4.5 වෙනත් බාහිර පාර්ශවයන් හා රාජ්‍ය ආයතන වෙත ලබාදුන් අරමුදලේ සම්පත්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයේ දී රු.මිලියන 4.2 කට තක්සේරු කර ඇති අරමුදලේ දේපළක් වූ මහනුවර පිහිටි ප්‍රීම්රෝස් ඉඩම 2013 වර්ෂයේ සිට මහරගම ශාසන සේවක සංගමයේ නුවර සංගමය ලෙස ගොඩනැගිලි ඉදිකර භික්ෂු පුහුණු මධ්‍යස්ථානයක් ලෙස පවත්වාගෙන යනු ලබන නමුත් එම දේපළ අරමුදල වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අරමුදලට අයත් හන්තාන පිහිටි වටිනාකම රු.මිලියන 4 ක්වූ ගොඩනැගිලි 02ක්, 2012 වර්ෂයේ සිට ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් ප්‍රයෝජනයට ගනු ලබන මුත් එම ගොඩනැගිලි අරමුදල වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4.6 කාර්යමණ්ඩල පරිපාලනය

මධ්‍යම සංස්කෘතික අරමුදලේ කාර්ය මණ්ඩල පරිපාලනය දුර්වල මට්ටමක පවතින අතර වසර කිහිපයක සිට නියමිත ක්‍රමවේදයන් අණපනත් සහ රෙගුලාසිවලට පටහැනිව බඳවා ගැනීම් පත්කිරීම් සහ උසස් කිරීම් සිදුකර තිබුණු බව පහත කරුණු අනුව නිරීක්ෂණය විය.

(අ) අරමුදලේ බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් නොවූ නීති නිලධාරි තනතුර සඳහා 2016 අගෝස්තු 26 දින සිට මාස 06 ක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත නිලධාරියෙකු බඳවාගෙන තිබුණු අතර එම කොන්ත්‍රාත් කාලයෙන් පසුව නැවතත් 2017 පෙබරවාරි 27 සිට මාස 06 ක කාලයක් දීර්ඝ කර තිබුණි. 2017 අගෝස්තු 27 දින සිට වසරක කාලයක් සඳහා අරමුදලේ බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් වූ සහකාර අධ්‍යක්ෂ (නීති) තනතුරට කොන්ත්‍රාත් පදනම මත එම නිලධාරියාවම පත්කර තිබුණි. තවද රු.45,930 ක් සහ රජයේ අනුමත අනෙකුත් දීමනා ද ඇතුළත් මාසික දීමනාවක් ලෙස 2016 අගෝස්තු 26 සිට 2018 පෙබරවාරි මාසය දක්වා රු. 1,164,229 ක් අරමුදල විසින් මෙම නිලධාරියාට ගෙවා තිබුණි. එසේම අරමුදල විසින් "සහකාර අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ (නීති)" තනතුර සඳහා ස්ථිර පදනම මත නිලධාරියෙකු බඳවාගැනීමට 2018 සැප්තැම්බර් 28 දින දක්වාම කටයුතු කර නොතිබුණි.

(ආ) අරමුදලේ අනුමත බඳවාගැනීමේ පරිපාටියේ 5.4 උපවගන්තිය අනුව සහකාර අධ්‍යක්ෂ (නීති) තනතුරට බඳවා ගනු ලබන්නේ වයස අවුරුදු 22 ට නොඅඩු අවුරුදු 45 ට නොවැඩි බාහිර අයදුම්කරුවන් වුවද සහකාර අධ්‍යක්ෂ (නීති) තනතුරට කොන්ත්‍රාත් පදනම මත පත්කරනු ලබන අවස්ථාව වන විට මෙම නිලධාරියා එම උපරිම වයස් සීමාව ඉක්මවාගොස් තිබුණි. ඒ අනුව අනුමත බඳවාගැනීමේ පරිපාටියට පටහැනිව මෙම පත්කිරීම කර තිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) නීති නිලධාරී/සහකාර අධ්‍යක්ෂ (නීති) තනතුරට අදාළ රාජකාරී ලැයිස්තුවට අනුව මධ්‍යම සංස්කෘතික අරමුදල වෙනුවෙන් අධිකරණවල නඩු කටයුතුවලට හා විමර්ශනවලට පෙනී සිටීම සහ බේරුම්කරණ ක්‍රියාදාමයන්ට සහභාගී වීම, මානව හිමිකම් කම්කරු විනිශ්චය සභා හා අනෙකුත් විමර්ශන වලදී පෙනී සිටීම, උත්තරවාද විරෝධතා හා අනෙකුත් අධිකරණ කටයුතුවලට අවශ්‍ය වන ලේඛන පිළියෙල කිරීම නීති නිලධාරී/සහකාර අධ්‍යක්ෂ (නීති) ගේ කාර්යයභාරය වී තිබුණි. ඒ අනුව අරමුදලේ නීති කෘත්‍යයන් වෙනුවෙන් ක්‍රියාකිරීමට නිලධාරියෙකු පත්කර සිටියදී බාහිර නීතිඥයන්ගෙන් සේවා ලබාගැනීමේ අවශ්‍යතාවයක් නොමැති වුවද එම කාර්යයන් බාහිර නීතිඥවරුන් මගින් ඉටුකරවා ගෙන සමාලෝචිත වර්ෂය තුළදී අරමුදල විසින් රු. 1,070,100 ක් ඒ සඳහා වැය කර තිබුණි.

(ඈ) විගණනය විසින් වරින් වර පෙන්වා දී තිබුණද අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු වලට මෙන්ම බඳවා ගැනීමේ පරිපාටියේ නොමැති විවිධ තනතුරු නාම මත බඳවාගැනීම් සිදුකර තිබුණි. ඒ අනුව බඳවා ගැනීමේ පරිපාටියේ අනුමත තනතුරු 08 කට අදාළව කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම් 10 ක්ද, බඳවා ගැනීමේ පරිපාටියේ අනුමත තනතුරු 05 කට අදාළව අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම් 184 ක් බඳවා ගැනීමේ පරිපාටියේ නොමැති තනතුරු 21 කට අදාළව බඳවා ගැනීම් 79 ක්ද වශයෙන් 273 දෙනෙකු බඳවා ගෙන තිබුණි.

(ඉ) අරමුදල විසින් විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව 2017 දෙසැම්බර් 31 දිනට අනියම් හා පුහුණු පදනම මත නිලධාරීන් / සේවකයින් 403 ක්, කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් / සේවකයින් 251 ක්, දිස්ත්‍රික් රේට සඳහා කම්කරුවන් 632 ක් හා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සඳහා බඳවාගත් නිලධාරීන් / සේවකයින් 934 ක්, සඳහා ගෙවූ වැටුප් හා දීමනා වල එකතුව රු.500,589,684 ක් විය.

(ඊ) ඉහත (ඉ) නිරීක්ෂණයේ සඳහන් බඳවා ගැනීම් වලට අතිරේකව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙනුවෙන් අරමුදලේ පාලක මණ්ඩල අනුමැතිය මත පුරාවිද්‍යා සහායකයින් සහ මුරකරුවන් සමාලෝචිත වර්ෂය තුළදී බඳවාගෙන තිබුණි. 2017 නොවැම්බර් සහ දෙසැම්බර් මාස තුළ එම පුරාවිද්‍යා සහායකයින් හා කම්කරුවන් සඳහා ගෙවූ වැටුප්, සේවක අර්ථ සාධක අරමුදලට දායක මුදල සහ සේවා නියුක්තයින්ගේ භාර අරමුදලට ගෙවූ මුදල රු.37,228,036 ක් විය.

(උ) අධ්‍යක්ෂ (පාලන හා මානව සම්පත් සංවර්ධන) තනතුර සඳහා අරමුදලේ බඳවා ගැනීමේ පටිපාටියේ 4.2.1.1 උපවගන්තියට පටහැනිව සුදුසුකම් නොමැති, 4.3 උපවගන්තිය අනුව අදාළ වයස් සීමාව ඉක්මවූ නිලධාරියකු 2017 අප්‍රේල් 07 දින කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන 2018 මැයි 31 දින දක්වා රු.1,253,343 ක් වැටුප් ගෙවා තිබුණි.

(ඌ) අධ්‍යක්ෂ (මුදල්) තනතුර සඳහා අරමුදලේ බඳවා ගැනීමේ පටිපාටියේ 4.2.3.1 (ආ) උපවගන්තියට පටහැනිව 2017 අප්‍රේල් 19 දින කොන්ත්‍රාත් පදනම මත සුදුසුකම් නොමැති නිලධාරියෙකු බඳවාගෙන 2018 මැයි 31 දින දක්වා රු.1,253,343 ක් වැටුප් ගෙවා තිබුණි.

(එ) අරමුදලේ බඳවාගැනීම් පරිපාටිය තුළ ඇතුළත් නොවූ අධ්‍යක්ෂ (ආගමික) තනතුර සඳහා 2017 ජුනි 21 දින කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් නිලධාරියකු සඳහා රු.1,060,521 ක වැටුප් ගෙවා තිබුණි.

(ඒ) බඳවා ගැනීමේ පරිපාටිය සකස් කිරීමේ කමිටුව විසින් නව බඳවාගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය, ව්‍යාපෘති හා කාර්යාල සඳහා පිළියෙල කරන සේවක සංඛ්‍යා ලේඛනය හා

ආයතනයේ නව සංවිධාන ව්‍යුහය ඇතුළත් වාර්තාව 2018 පෙබරවාරි 14 දිනැති ලිපිය මගින් අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර තිබුණු අතර 2018 සැප්තැම්බර් 28 දින දක්වා එම පරිපාටිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීම සඳහා අරමුදල විසින් ඉදිරිපත් කර නොතිබුණි.

**5. තිරසාර සංවර්ධනය**

---

**5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

---

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**6. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

---

**6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

---

2003 ජූනි 02 දිනැති හා අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 උප වගන්තිය ප්‍රකාරව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් එම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ මාස 5 දින 23 ක ප්‍රමාදයකින් පසුව 2018 අගෝස්තු 23 දිනදීය.

**6.2 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය**

---

**6.2.1 ප්‍රසම්පාදනයන්**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) උපදේශකවරුන් තෝරාගැනීමේ හා සේවයේ යෙදවීම සම්බන්ධයෙන් වූ 2007 මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තිය ප්‍රකාරව බඳවා ගැනීමේ පරිපාටිය සකස් කිරීමේ කාර්යය සම්බන්ධයෙන් අරමුදල විසින් සේවා පැවරුම් කොන්දේසි ලේඛනයක් (TOR) පිළියෙල කර නොතිබුණි.

(ආ) මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.4 වගන්තිය ප්‍රකාරව, 2017 මැයි 30 දිනැති පාලක මණ්ඩල පත්‍රිකා අංක 202.17.01 මගින් නිලධාරීන් 03 දෙනෙකුගේ නම් යෝජනා කර එම තිදෙනා අරමුදලේ බඳවා ගැනීමේ පරිපාටිය සකස් කිරීමේ කමිටුවට පත්කර තිබුණි. එහෙත් මෙම නිලධාරීන්ගේ පළපුරුද්ද, එම නිලධාරීන් බඳවා ගැනීමේ පරිපාටිය සකස් කිරීමට ඇති සුදුසුකම් යනාදිය පරීක්ෂා කිරීමෙන් අනතුරුව ඔවුන් පත් කරනු ලැබුවේ ද යන්න තහවුරු කර ගැනීම සඳහා සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

(ඇ) උපදේශන සේවා සම්බන්ධයෙන් වූ මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.6 වගන්තිය ප්‍රකාරව, පාරිශ්‍රමික, ඍජු වියදම්, නිවාඩු,රක්ෂණ, දෛනික දීමනා හා සේවා පැවරුම් කොන්දේසි ලේඛනයක් (TOR) යනාදිය ආවරණය වන සේවා කොන්දේසි ඇතුළත් විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමකට හැකි අවස්ථාවලදී අත්සන් තැබිය යුතුය. එහෙත් බඳවා ගැනීමේ පරිපාටිය සකස්කිරීමේ කමිටුව සමග එවැනි ගිවිසුමකට අත්සන් තැබීමට අරමුදලට හැකියාව තිබුණද අරමුදල විසින් එවැනි ගිවිසුමකට ඇතුළත් වී නොතිබුණි.

(ඈ) උපදේශන සේවා සම්බන්ධයෙන් වූ මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.6.4 වගන්තිය ප්‍රකාරව, පිළිගත හැකි අත්තිකාරම් ගෙවීමේ සුරක්ෂණයක් මත කොන්ත්‍රාත් මුදලින් සියයට විස්සක (20%) ක උපරිමයක් අත්තිකාරම් වශයෙන් ගෙවිය හැකි වුවත් ඊට පටහැනිව අත්තිකාරම් ගෙවීමේ සුරක්ෂණයක් නොමැතිව අරමුදල විසින් කොන්ත්‍රාත් මුදලින් සියයට 40 ක් වූ රු.360,000 ක් අත්තිකාරම් ලෙස ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය.

(ඉ) කොළඹ 07 පිහිටි, අරමුදලේ ප්‍රධාන කාර්යාලය අලුත් වැඩියා කටයුතු සිදුකරන තෙක් අරමුදලේ කාර්යාලය පවත්වාගෙන යාමට ස්ථානයක් තෝරාගැනීමේදී අරමුදල විසින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර නොතිබුණු අතර සී/ස නාගරික ආයෝජන හා සංවර්ධන (පුද්ගලික) සමාගමට අයත් සෙත්සිරිපාය II වන අදියරෙහි 4 වන මහලෙහි “ඩී” පර්යන්තය අරමුදලේ කාර්යාලය කුලී පදනම මත පවත්වාගෙන යාම සඳහා තෝරාගෙන තිබුණි. ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය නොකිරීම හේතුවෙන්, විකල්ප අවස්ථා ඇගයීම තුළින් අවම පිරිවැය සහිත ස්ථානයක් තෝරාගැනීමට තිබූ අවස්ථාව අරමුදල විසින් අහිමිකරගෙන තිබුණි. ඒ අනුව ගොඩනැගිලි කුලිය , සනීපාරක්ෂක කටයුතු සඳහා ගාස්තු සහ විදුලි ගාස්තු ලෙස පිළිවෙලින් රු. 18,308,924 ක්, රු. 325,283 ක් හා රු. 1,040,076 ක් 2017 මාර්තු මාසයේ සිට 2018 අප්‍රේල් මාසය දක්වා අරමුදල විසින් ගෙවා තිබුණි. නමුත් 2018 සැප්තැම්බර් 28 දින වන විටද ප්‍රධාන කාර්යාලයේ අලුත්වැඩියා කටයුතු ආරම්භ කිරීමට අරමුදල විසින් අපොහොසත්ව තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය සඳහා අරමුදල වෙනුවෙන් පිළියෙල කළ ප්‍රසම්පාදන සැලැස්මෙහි, ප්‍රාදේශීය කාර්යාල සඳහා ප්‍රසම්පාදනය කරනු ලබන භාණ්ඩ, වැඩ හා සේවා ඇතුළත් කර නොතිබුණි.

**6.3 අයවැය පාලනය**

2017 වර්ෂය සඳහා වූ සංශෝධිත අයවැය ලේඛනය මඟින් පරිත්‍යාග ලෙස රු.3,000,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබූ නමුත් රු.19,373,794 ක් ලබා දී තිබුණි.

**6.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය ප්‍රකාරව 2013 වර්ෂයේ සිට 2016 දක්වා වූ වර්ෂ සඳහා වාර්ෂික වාර්තා 2018 සැප්තැම්බර් 28 දින වනවිටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**7.** **පද්ධති හා පාලනයන්**

**--------------------------**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දූර්වලතා සම්බන්ධයෙන් වරින්වර අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල් වෙත දැනුම් දෙන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| **පද්ධති හා පාලන ක්ෂේත්‍ර** | | **නිරීක්ෂණ** |
| --- | --- | --- |
| ( අ) | ගිණුම්කරණය | (i) අනුරූ, ප්‍රකාශනවල නිෂ්පාදන පිරිවැය හඳුනාගෙන නොතිබීම. |
| | | (ii) ඇතැම් ණය ශේෂවල ගැලපුම්වලට අදාල ජ'නල් සටහන් ඉදිරිපත් කර නොතිබීම. |
| (ආ) | කාර්ය මණ්ඩල පරිපාලනය | (i) පුරප්පාඩු පිරවීමට කටයුතු නොකිරීම හා දීර්ඝ කාලයක සිට ඇතැම් තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් සේවයේ යෙදවීම. |
| | | (ii) බඳවා ගැනීමේ පරිපාටිය සංශෝධනය කිරීමට කටයුතු නොකිරීම. |
| | | (iii) පෞද්ගලික ලිපිගොනු නිසිලෙස නඩත්තු නොකිරීම |
| | | (iv) නිලධාරීන් බඳවාගැනීමේදී මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු නොකිරීම. |
| (ඇ) | ප්‍රසම්පාදනය | (i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය නොකිරීම.<br>(ii) ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීමේ අඩුපාඩු පැවතීම. |
| (ඈ) | අයවැය පාලනය | ඇස්තමේන්තු සකස් කිරීමේ අඩුපාඩු පැවතීම. |
| (ඉ) | ණයගැති පාලනය | දිගුකලක සිට පවතින ණය ශේෂ අයකර ගැනීමට කටයුතු නොකිරීම. |